සැ. යු. - 2017.03.24 වැනි දින පළ වූ අංක 2012 දරන ගැසට් පත්‍රයේ I : I සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,013 - 2017 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2017.03.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 326 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත 2017 මාර්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 අප්‍රේල් මස 21 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අප්‍රේල් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

## මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

1894 අංක 12 දරන නොවටිනා ලේඛන විනාශ කිරීමේ ආඥාපනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

මෙම අධිකරණය ඉදිරියේ අවසන් වී ඇති වසර 05 කට වඩා පැරණි පහත උපලේඛනයේ දක්වා ඇති නඩු වාර්තා 1894 අංක 12 දරන නොවටිනා ලේඛන විනාශ කිරීමේ ආඥාපනතේ 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම දැන්වීම ප්‍රසිද්ධ කරන ලද දින සිට මාස තුනක් (03) ඉකුත්වීමෙන් පසුව විනාශ කරන බව මෙයින් දන්වා සිටිමි.

02. උපලේඛනයේ දක්වා ඇති නඩු වාර්තාවල පිටපත් හෝ වෙනත් ඊට අදාල ලේඛන ලබාගැනීමට උනන්දුවක් දක්වන තැනැත්තන් විසින් මෙම දැන්වීම ප්‍රසිද්ධ කරන ලද දින සිට මාස තුනක් (03) ඉකුත්වීමට පෙර ඒ සඳහා ඉල්ලුම් කල යුතු බවට ද කිසියම් නඩු වාර්තාවක් විනාශ නොකල යුතු බවට උනන්දුවක් දක්වන තැනැත්තකු සිටීනම් මෙම දැන්වීම ප්‍රසිද්ධ කරන ලද දින සිට මාස තුනක් ඉකුත්වීමට පෙර තමා විසින් ම හෝ නීතිඥවරයෙකු මඟින් යථා පරිදි ඉදිරිපත් කරනු ලබන පෙත්සමක් මගින් සාධාරණ හේතු ඉදිරිපත් කිරීමට ක්‍රියා කල යුතු බවට ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිසා විනිසුරු - මාවනැල්ල.

2017 මාර්තු 09 වැනි දින,
මාවනැල්ල,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.

**උපලේඛනය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9578 | 19111 | 10100 | 19112 | 10243 | 19235 | 10245 | 19243 |
| 13252 | 19658 | 14426 | 19672 | 14904 | 19752 | 18049 | 20370 |
| 18997 | A 2705 | 19106 | A 2766 | 19107 | A2764 | 19108 | |

03-1150

---

# විවිධ දැන්වීම්

## බස්නාහිර පළාතේ කොළඹ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන වාණිජ මහාධිකරණයේ දී ය

නඩු අංකය : CHC 02/2017 CO
ස්වභාවය : අවසාන කිරීම
කාර්යය පටිපාටිය : ලඝු

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ ලන්සිගම, කටුනේරිය, ලයනල් ප්‍රනාන්දු මාවත, ප්‍රොවිඩන්ස් හි පිහිටා ඇති එම්. එල්. එම්. ප්‍රොපර්ටි ඉන්වෙස්ට්මන්ට් ගෲප් යන සමාගම වසා දැමීම කාරණය සම්බන්ධවයි.

මහගුරුගේ ලෙස්ලි පීටර් ප්‍රනාන්දු,
ඩිවයින් ප්‍රොවිඩන්ස් ලයනල් ප්‍රනාන්දු මාවත,
ලන්සිගම, කටුනේරිය.

.......................................*පෙත්සම්කරු.*

වර්ෂ 2017 ක් වූ මාර්තු මස.

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ණණන් බේරා වසා දැමීම සඳහා මහගුරුගේ ලෙස්ලි පීටර් ප්‍රනාන්දු විසින් 2017 පෙබරවාරි මස 02 වන දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2017.06.07 වන දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධයෙන් නියෝගයක් කිරීම සඳහා සහය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාග මේ කවර හෝ ණය හිමියකු හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේදී පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අත්සන් කළේ,

නීතිඥ ඒ. ඩී. ජී. රූබසිංහ,
අංක 432/1ඩී, ශ්‍රී විජය මාවත, පැලැන්වත්ත, පන්නිපිටිය.
දුරකථන : 071 4125210

***සටහන.***- එකී පෙත්සම සම්බන්ධව විමසීමේදී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකුට එසේ කිරීමට හැකි සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ ඒ. ඩී. ජී. රූබසිංහ මහතාට ලිඛිතව දන්වා භාර දිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන ලද පුද්ගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම සහ ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයෙකු හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකුගේ සමාගමක් නම්, නීතිඥවරයා/නීතිඥවරිය විසින් අත්සන් කළ යුතු ය. 2017.04.27 වැනි දින ප.ව. 6.00 ට පෙර භාර දිය යුතු ය. නැතහොත් තැපැල් මගින් එවන්නේනම් ඔවුන් (ඉහත නම් සඳහන් නීතිඥවරුන්) උක්ත දිනට ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව තැපැල් මගින් එවිය යුතු ය.)

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

03-1339

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.